# මූලික පිරිවෙනේ දැනට ඉගැන්වෙන විෂය මාලාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති
පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ
නිබන්ධනය.

80 M.Phil - 71.

එච්.එම්.ටී.බී.හේරත්,
අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය,
කොළඹ.

1983 අප්‍රේල් දින.

UCLIB
388303
UNIVERSITY OF COLOMBO LIBRARY SRI LANKA

# සංක්ෂේපයෙන්.

මූලික පිරිවෙනේ දැනට උගැන්වෙන විෂය මාලාව මෙම පර්යේෂණයෙහි ලා විමර්ශනයට භාජනය කෙරෙන විෂය ක්ෂේත්‍රයයි. 'පිරිවෙන් අධ්‍යාපනය' නම් ප්‍රථම පරිච්ඡේදයෙහි අඩංගු වන්නේ පිරිවෙන් අධ්‍යාපනයේ විකාශනය පිළිබඳ තොරතුරුයි. පරිච්ඡේදය ආරම්භ කෙරෙනුයේ 'අධ්‍යාපනය' යන්න ගැන කෙටි හැඳින්වීමකිනි. අනතුරු ව 'පිරිවෙන' යන්න සම්බන්ධයෙන් පුළු අර්ථ විග්‍රහයක් ද අඩංගු වන අතර, ඉක්බිති ව මිහිඳු හිමියන්ගෙන් ඇරඹුණු මෙරට බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදායය ක්‍රමයෙන් විකාශනය වෙමින් පිරිවෙන් අධ්‍යාපනය නමින් අද දක්වා පැවත එන අයුරු විස්තර කෙරෙයි. පර්යේෂණයට භාජනය වූ මූලික පිරිවෙනේ බිහිවීමට පදනම් වී ඇති මූලික පසුබිම ද මේ යටතේ සාකච්ඡාවට භාජනය වේ.

"පිරිවෙන් විෂය මාලාවේ ඓතිහාසික පරිනාමය හා මූලික පිරිවෙන් විෂය මාලාව' නම් දෙවැනි පරිච්ඡේදයෙහි ආරම්භක කොටසෙහි, 'විෂය මාලාව' යන්න පිළිබඳ ව සංක්ෂිප්ත නිර්වචනයක් ඇතුළත්ය. එහි ලා අධ්‍යාපනඥයින් විසින් ඒ සම්බන්ධව දක්වා ඇති අදහස් විමසීමට ලක් කර ඇත. අනතුරු ව මෙම පර්යේෂණයෙහි ලා පාදක කර ගත හැකි වන ලෙස අධ්‍යාපනඥයින් විසින් දක්වා ඇති විෂයමාලා රටා හා විවිධ ආකෘති පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කෙරේ. පිරිවෙන් අධ්‍යාපනයේ විෂය මාලාවේ ඓතිහාසික පරිනාමය විස්තර කෙරෙනුයේ ඉන් පසුවයි. විශේෂයෙන් මෙරට බෞද්ධ යුගයේ ආරම්භයේ සිට වර්තමානය දක්වා පිරිවෙන් විෂය මාලාවේ ඓතිහාසික විකාශනය පිළිබඳ තොරතුරු මේ යටතේ ඉදිරිපත් කෙරේ.

(අ) ආගමික විෂය මාලාව,

(ආ) ශාස්ත්‍රීය විෂය මාලාව,

(ඇ) වෘත්තීය හා ශිල්පීය විෂය මාලාව

යන අනු මාතෘකා යටතේ අදාළ තොරතුරු සවිස්තර ව දැක්වෙයි.

3 වෙනි පරිච්ඡේදයෙහි ලා විමර්ශනය කෙරෙනුයේ මූලික පිරිවෙන් විෂය මාලාවේ න්‍යායාත්මක පදනමයි. මෙහි ලා සම්භාවිත අධ්‍යාපන න්‍යායන්ට අනුගත ව තත් විෂය මාලාවෙහි දක්නට ඇති රටා ලක්ෂණ සහ ආකෘතික ස්වරූපය පිළිබඳ සමාලෝචනයක් ඉදිරිපත් කෙරේ.

මූලික පිරිවෙන්හි ශිෂ්‍යයන්ගේ වයස් හා අධ්‍යාපන මට්ටම්හි විවිධත්වයත්, නිර්දිෂ්ට විෂය මාලාවේ ස්වභාවයත් මෙම සාධක දෙකේ අන්‍යෝන්‍ය ගැළපීමත් යන කරුණු පිළිබඳ ව විස්තරයක් 4 වෙනි පරිච්ඡේදයෙහි ඇතුළත් වෙයි.

පර්යේෂණ ප්‍රවේශය නමින් රචනා කර ඇති 5 වෙනි පරිච්ඡේදයෙහි ලා විස්තර කෙරෙනුයේ අධ්‍යයන නියැදි ක්ෂේත්‍රය පිළිබඳවයි. වර්ෂ 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත යටතේ වර්ග කොට දැනට ක්‍රියාත්මක ව පවත්නා සියලුම පිරිවෙන් පිළිබඳවත්, ඒවායේ ගුරුවරුන් හා ශිෂ්‍යයන් පිළිබඳවත් සංඛ්‍යාත්මක දත්ත අඩංගු විස්තරයක් එහි ලා මූලික ව ඉදිරිපත් කෙරේ. අනතුරු ව අධ්‍යයන නියැදිය සඳහා තෝරා ගත් ගම්පහ දිස්ත්‍රික්කයෙහි පිරිවෙන් අධ්‍යාපනයේ ක්‍රියාත්මක ස්වරූපයත්, දත්ත ලබා ගත් ආකාරයත් සවිස්තර ව දක්වා ඇත. අදාළ දත්ත විශ්ලේෂණයට භාජනය කළ අන්දම ද එහි ලා විස්තර කොට ඇත.

60 ක් පමණ වූ ගුරු නියැදියෙන් හා 350 ක් පමණ වූ ශිෂ්‍ය නියැදියෙන් ප්‍රශ්නාවලී මගින් ලබා ගන්නා ලද මූලික පිරිවෙන් විෂය මාලාව පිළිබඳ ව අදහස් විශ්ලේෂණයට භාජනය වන්නේ 6 වෙනි පරිච්ඡේදයෙහි දී ය. අදාළ දත්ත සටහන්, වගු හා රූප සටහන් ආදිය මගින් ඉදිරිපත් කරමින් ඒ සම්බන්ධව අර්ථ කථන ද මේ යටතේ දක්වා ඇත.

අවසාන වශයෙන් පර්යේෂණය තුළින් බැසගත් නිගමන හා ඵලදායි අධ්‍යාපනයක් ලබා දීම සඳහා මූලික පිරිවෙනේ අධ්‍යාපන කටයුතු හා එහි විෂය මාලාව සම්බන්ධයෙන් ගත යුතු පියවරයන් අඩංගු යෝජනා 7 වන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ.